# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 23 දරන ශාරීරික දඬුවම් (ඉවත් කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 2005 අගෝස්තු මස 02 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 අගෝස්තු මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. 4.25 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2005 අංක 23 දරන ශාරීරික දඬුවම් (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2005 අගෝස්තු මස 02 වන දින]

එල්. ඩී.–ඕ. 55/2004.

**ශාරීරික දඬුවම් ආඥාපනත ඉවත් කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2005 අංක 23 දරන ශාරීරික දඬුවම් (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — *ලුහුඬු නාමය.*

2. (21 වන අධිකාරය වූ) ශාරීරික දඬුවම් ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ. — *(21 වන අධිකාරය වූ) ශාරීරික දඬුවම් ආඥාපනත ඉවත් කිරීම.*

3. යම් ලිඛිත නීතියක් යටතේ අධිකරණය විසින් පනවනු ලැබිය යුතු දණ්ඩනයක කොටසක් වශයෙන් කස පහර දීමේ දණ්ඩනය ඇතුළත් කර ඇති කවර හෝ අවස්ථාවක දී මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට කස පහර දීමට අදාළ එම දණ්ඩනයේ එම කොටස එම පනතින් අත්හැරීම මගින් එම පනත සංශෝධනය කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය. — *කසපහර දීමේ දණ්ඩනය වෙනත් ලිඛිත නීති වලින් අත්හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.*

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — *අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.